**මෝටර් රථ ප්‍රවාහන දෙපාතර්මේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදල - 2023**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වායු විමෝචන පරීක්ෂණ භාරකාර අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාල තොරතුරුද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලි සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- තත්ත්වාගණනය කළ මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවියහැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනා ගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත්කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේද යන බව;
- යම් අදාල ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධිවිධානයකට අනුකූලව අරමුදල ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව, සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාල නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (i) | අරමුදල වෙත මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවෙන් ජලය, විදුලිය හා කාර්යාල පහසුකම් සපයා ගැනීම වෙනුවෙන් ගෙවිය යුතු අගය ගණනය කොට ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබීම හේතුවෙන් වර්ෂයට අදාල එකී වියදම් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී දෙපාර්තමේන්තු නිලධාරීන් සමග සාකච්ජා කර නිවැරදි ක්‍රමවේදයක් සකස්කර ඒ අනුව ගෙවීම් කිරීමට කටයුතු කරමි. | වර්ෂයට අදාළ සියලු වියදම් නිසි පරිදි හදුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම. |
| (ii) | ගිණුම් වර්ෂය තුල අරමුදලේ කාර්යයන් සඳහා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු නිලධාරීන් පූර්ණ කාලීනව සේවයේ යොදවා ගෙන තිබූ නමුත් ඔවුන්ගේ සේවය වෙනුවෙන් ගෙවන ලද රු.3,067,810ක් වූ වැටුප් හා වේතන අරමුදලේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබීම හේතුවෙන් වසරේ අතිරික්තය එම ප්‍රමාණයෙන් වැඩියෙන් දක්වා තිබුණි. | වාහන වායු විමෝචන භාරකාර අරමුදලේ ක්‍රියාකාරකම් සඳහා නීතිමය බලය මෝටර් රථ පනත මගින් ලැබී තිබීම නිසාත් අරමුදලේ හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අතර සම්බන්ධතාවය පවත්වා ගැනීම සඳහාත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ සේවය කරනු ලබන නිලධාරීන් වාහන වායු විමෝචන භාරකාර අරමුදලට අනුයුක්ත කරනු ලබයි. ඔවුන් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ස්ථිර නිලධාරීන් බැවින් දෙපාර්තමේන්තු මගින්ම වැටුප් ගෙවා ඇත. | වර්ෂයට අදාළ සියලු වියදම් නිසි පරිදි හඳුනා ගෙන මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කිරීම. |
| (iii) | අරමුදල විසින් පවත්වාගෙන යන ගිණුම් පොත්පත් හා ලේඛණවලට අනුව 2023 ජනවාරි 01 දිනට දේපල යන්ත්‍ර හා උපකරණ අයිතම 3ක පිරිවැය රු.283,534,928ක් හා සමුච්චිත ක්ෂය වීම් රු.258,245,984ක් වියයුතු වුවත් මූල්‍ය ප්‍රකාශන තුල ඇතුලත් සටහන් අංක 01හි එකී දේපල යන්ත්‍ර හා උපකරණ අයිතමයන්හි පිරිවැය රු.230,008,038ක් හා සමුච්චිත ක්ෂය වෙන් කිරීම් රු.204,718,592ක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශන තුල දේපල යන්ත්‍ර හා උපකරණ වලට අදාල තත්‍ය අගයන් නිරූපණය කර නොතිබුණි. | මෙම ගිණුම්කරණ අඩුපාඩුව ගිණුම්කරණ ප්‍රමිතීන්වලට අනුකූලව නිවරැදි කිරීමට කටයුතු කරන බව. | පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව ගිණුම් තැබීම. |
| (iv) | අරමුදල විසින් 2018 දෙසැම්බර් 17 මිලදී ගෙන ඇති නමුත් 2020 වර්ෂයේ මධ්‍යම පරිසර අධිකාරිය හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත පවරා දී ඇති එකතු පිරිවැය රු.මිලියන 129.99ක් වන වායු තත්ත්ව මැනීමේ උපකරණ තුනක් සඳහා රු.මිලියන 17.650ක ක්ෂය වීම් ගණනය කර මූල්‍ය | එකඟවෙමි. නිවැරදි කිරීමට කටයුතු කරමි. | පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව ගිණුම් තැබීම. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශන තුළ ඇතුළත් කිරීම හේතුවෙන් ජංගම නොවන වත්කම් උක්ත පිරිවැයේ අගයෙන් වැඩියෙන් ද වසරේ අතිරික්තය ක්ෂයවීම් අගයෙන් අඩුවෙන් ද දක්වා තිබුණි. | | |
| (v) | අරමුදල සතුව පැවති රු.47,247,000ක් පිරිවැය වූ සංසරණ වායු තත්ත්ව මැනීමේ ඒකකයක් 2023 මාර්තු 10 දින ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත පවරා දී තිබුණි. එකී පවරා දීමට අදාල ගිණුම් තැබීමේ දී පවරා දීම සිදු කල දිනය දක්වා වූ රු.1,786,325ක ක්ෂයවීම්වල අගය ගැලපිය යුතු වුවත් ඊට අනුකූල නොවන සේ ක්ෂයවීම් ලෙස රු.3,106,650ක් ගණනය කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය තුල දක්වා තිබීම හේතුවෙන් වසරේ අතිරික්තය රු.1,320,325කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉහත ජංගම වායු තත්වය පරික්ෂාකිරීමේ රථය 2023.03.10 දින ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත නීත්‍යානුකූලව පවරා දී ඇත. නමුත් ඔවුන් විසින් ඉහත රථය ලියාපදිංචි කිරීම සඳහා 2023.03.10 දිනම ඉදිරිපත් නොකිරීම නිසා 2023.04.30 ගිණුම් පොත් වලින් ඉවත් කරන ලදි. ගිණුම්කරණමය නිවැරදි කිරීම් ඉටු කිරීමට කටයුතු කරමි. | පිළිගත් ගිණුම්කරණ ක්‍රමවේදයන්ට අනුකූලව ගිණුම් තැබීම. |

**1.5.2 අරමුදලේ අඛණ්ඩ පැවැත්ම**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 17/1615/702/002-xvii හා 2017 අගෝස්තු මස 09 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීම් තීරණය ප්‍රකාරව නිකුත් කර ඇති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2018හි 03 හා 04 ඡේදය ප්‍රකාරව 2018 වර්ෂයේ දී වායු විමෝචන අරමුදල ඇවර කර වගකීම් පියවා වසා දැමීමට කටයුතු කළ යුතු වුවත් අමාත්‍ය මණ්ඩල අනුමැතියකින්, මුදල් අමාත්‍යාංශය සහ භාණ්ඩාගාර අනුමැතියකින් තොරව රේඛීය අමාත්‍යවරයා මගින් අරමුදලේ අයවැය ලේඛණ අනුමත කර ගනිමින් අරමුදල පවත්වාගෙන යාමට අරමුදලේ භාරකාර මණ්ඩලය කටයුතු කර තිබුණි. නමුත් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී අරමුදලේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත බව අනාවරණය කිරීමට කළමණාකරණය කටයුතු කර නොතිබුණි. | වාහන වායු විමෝචන භාරකාර අරමුදල ඇවර කිරීම සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලද අතර ඒ සඳහා මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ ලබාදෙන ලෙස ඉල්ලා ඇත.එම නිරීක්ෂණ ලබාදීම සඳහා කමිටුවක් පත් කළ අතර එම කමිටු වාර්තාව අමාත්‍ය මණ්ඩලය වෙත ලබා දෙන ලදී. එම නිරීක්ෂණ ඇතුලත් වාර්තාව නැවත මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණ වලට ලබා දෙන ලද අතර මුදල් අමාත්‍යාංශය විසින් එම තීරණ ක්‍රියාත්මක කරන ලෙස නිර්දේශ ලබා දෙන ලදී. ඉන් අනතුරුව එම නිර්දේශය අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික මෙහෙයුම් මැදිරියට යොමු කරන ලද අතර එහිදී මෙම අරමුදල තවදුරටත් පවත්වා ගෙන යාම වෙනුවට වසා දැමීමට කටයුතු කරන ලෙස දන්වන ලදී. එම තීරණය අනුව අමාත්‍ය මණ්ඩල විසින් ඒ සම්බන්ධ නිරීක්ෂණ ලබා දෙන ලෙස නැවතත් මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව හා පරිසර අමාත්‍යාංශය වෙත දන්වන ලදී. අදාල උපදෙස් අනුව අවශ්‍ය පැහැදිලි කිරීම් සිදු කර අමාත්‍ය මණ්ඩල වෙත ලබා දී ඇති අතර එම නිරීක්ෂණ අමාත්‍ය මණ්ඩලය විසින් ජාතික මෙහෙයුම් මැදිරියට යොමු කිරීමෙන් අනතුරුව ජාතික මෙහෙයුම් මැදිරිය විසින් ඒ සම්බන්ධව සාකච්ඡාවට බඳුන්කරමින් පවතී. | අදාල නෛතික පරිසරය තුල අවශ්‍ය කටයුතු ඉටු කිරීම. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|---|
| (i) | වායු විමෝචන පරීක්ෂා සිදුකරන පෞද්ගලික සමාගම් දෙකක් සමඟ ඇතිකරගත් ගිවිසුම් ප්‍රකාරව එක් එක් වාහනය සඳහා අය කරන පරීක්ෂණ ගාස්තුවෙන් සියයට 10ක් වායු විමෝචන අරමුදල වෙත ගෙවිය යුතු වේ. එහෙත් උක්ත පෞද්ගලික සමාගම් සිදුකරන ලද පරීක්ෂණ සංඛ්‍යාව, ඔවුන් අය කරගෙන ඇති පරීක්ෂණ ගාස්තුව හා ඒ අනුව වායුවිමෝචන අරමුදල වෙත ලැබිය යුතු ආදායම පිළිබඳව පරීක්ෂා කර රජයට ලැබිය යුතු ආදායම් නිසිලෙස ලැබුණේ ද යන්න තහවුරුවකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ අදාළ සමාගම් දෙක අරමුදල වෙත ප්‍රේෂණය කර ඇති රු.මිලියන 336.47ක් අගය අරමුදලේ ආදායම ලෙස හඳුනාගෙන ගිණුම් ගත කර තිබුණි. | අදාල ආයතනවල තොරතුරු පද්ධතිය වෙත පිවිස සිදුකරන පරීක්ෂණ ප්‍රමාණයන් පිළිබඳ තොරතුරු ඕනෑම මොහොතක ලබාගැනීමට අවශ්‍ය මුරපද වායු විමෝචන කාර්යාලය සතුව ඇත. ඒ අනුව අවස්ථානුකූලව සැසඳුම් සිදුකරනු ලබයි. තවදුරටත් විගණන කාර්යාලයේ යෝජනා අනුව කොන්ත්‍රාත්කාර දුම් පරීක්ෂණ ආයතනවල පරිඝනක පද්ධතියේ පද්ධති විගණනයක් සිදුකිරීම සඳහා මූලික කටයුතු කරමින් පවතී. | ආදායම නිසි පරිදි සත්‍යාපනය කළ යුතු වීම. |
| (ii) | දුම් පරීක්ෂණ සිදු කරන සමාගම් සිදුකර ඇති පරීක්ෂණයන් සම්බන්ධ තොරතුරු ලබා ගැනීමට ඔවුන්ගේ පරිගණක පද්ධතීන් වෙත ප්‍රවේශ වීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙලක් සකස් කර නොතිබූ අතර අවශ්‍ය අවස්ථාවන්හි දී ඔවුන්ගේ පද්ධති වලට ප්‍රවේශ වීම සඳහා ඩොංගල් (dongle) ලබාදී ඇතත් ඒවා නිසි පරිදි ක්‍රියාත්මක නොවීම හේතුවෙන් තොරතුරු ලබා ගැනීම දුෂ්කර වී තිබුණි. | කොන්ත්‍රාත් සමාගම් විසින් විමෝචන පරීක්ෂණ වැඩසටහන විගණනය සහ කළමනාකරණය කිරීම සඳහා ස්වයංක්‍රීය මෘදුකාංග දෙකක් නිර්මාණය කර දෛනිකව සිදු කරනු ලබන වාහන වායු විමෝචන පරීක්ෂණ මාර්ගගතව පරීක්ෂා කිරීම සඳහා ඔවුන්ගේ මධ්‍යම දත්ත පද්ධතියට පිවිසීමට වාහන වායු විමෝචන කාර්යාලය වෙත Dongal ලබා දී ඇත.කෙසේ වෙතත් සාමාන්‍ය කාර්යාල වේලාවන් වලදී වාහන වායු විමෝචන පරීක්ෂාවන් 30000 ක් පමණ සිදු කරන බැවින් භාගත කිරීමේදී මන්දගාමී ස්වභාවයක් ඇතිවේ. මෙම දෝෂය නිවැරදි කර දෙන ලෙස අදාල සමාගම් වෙත ලිඛිතව දන්වා ඇත. | ආදායම් නිසි ලෙස හඳුනා ගැනීමට කටයුතු කිරීම. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

### 1.6.1 අත්තිකාරම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| යම්කිසි විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් අත්තිකාරම් ලබාදිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල මාණ්ඩලික ශ්‍රේණියට අයත් නොවන නිලධාරීන් 14දෙනෙකු වෙත අවස්ථා 106ක දී එකතු | යම් යම් ප්‍රායෝගික සිදුවීම් නිසා ප්‍රමාදයන් සිදුවී ඇති බව වාර්තා වී ඇත. ඉදිරියේදී ලබා ගනු ලබන අත්තිකාරම් මුදල් කාර්යය නිමවූ වහාම පියවීමට උපදෙස් ලබා දෙන ලදී. | මනා අභ්‍යන්තර පාලනයක් සඳහා අවශ්‍ය |

| | |
|---|---|
| වටිනාකම රු.2,737,370ක තත්කාර්ය අත්තිකාරම් ලබාදී තිබුණි. එම කාර්යය නිම කළ විගසම අත්තිකාරම් පියවිය යුතු වුවත් සමාලෝචිත වර්ෂය තුල නිලධාරීන් 17දෙනෙකු අවස්ථා 34ක දී ලබාගත් රු.1,183,010ක අත්තිකාරම් පියවීම සඳහා දින 21 සිට දින 77 දක්වා කාලයක් ගත කර තිබුණි. | පිළිවෙත් නිශ්චය කිරීම |

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිදෙර්ශය |
|---|---|---|---|
| (අ) අංක 01/2020 හා 2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛය | | | |
| (i) මු.රෙ. 876 (2) (අ) | දැනට පවතින අරමුදල් ක්‍රියාත්මක වීම ජාතික අවශ්‍යතාවක් බව පෙනී යන්නේ නම් හා එම අරමුදල් සඳහා නිසි පරිදි පනතක් මඟින් පාර්ලිමේන්තුවේ අනුමත වී නොමැති නම් එම අරමුදල් සඳහාමෙම චක්‍රලේඛය නිකුත් කර වසරක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් එවැනි අනුමැතියක් ලබා නොතිබුණි. | 2018 දී වාහන වායු විමෝචන භාරකාර අරමුදල ඇවර කිරීමට ගත් තීරණය අත්හිටුවීම සඳහා අමාත්‍ය මණ්ඩලයට කරුණු දක්වමින් 2019 පෙබරවාරි මාසයේදී ප්‍රවාහන අමාත්‍යවරයා විසින් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් යොමු කරන ලදී. එහිදී මුදල් අමාත්‍යවරයා හා ප්‍රවාහන අමාත්‍යවරයා සාකච්ඡා කර මේ සඳහා තීරණයක් ගෙන එය නැවත අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කරන ලෙස දන්වා තිබුණි. නමුත් එවකට රටේ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් මේ පිළිබඳ තීරණයක් ගැනීම ප්‍රමාද වී ඇත. එසේවුවද අරමුදලේ පැවැත්ම සඳහා භාණ්ඩාගාර ලේකම් විසින් වායු විමෝචන භාරකාර මණ්ඩලයේ සභාපති ධුරයට භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයෙකු පත් කිරීම මේ වනතෙක්ම සිදු කර ඇති අතර ඒ අනුව භාරකාර මණ්ඩල රැස්වීම් පවත්වා තිබේ.<br>එසේම මේ සම්බන්ධයෙන් 2023 ජනවාරි මාසයේ අමාත්‍යමණ්ඩලය වෙත කරුණු දක්වන ලදී. එහිදී අරමුදල අඛණ්ඩ පැවැත්ම පිළිබඳ තීරණයක් ගැනීම සඳහා කමිටුවක් පත්කර ඇති අතර එහි නිර්දේශ අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කර ඇති අතර වාහන වායු විමෝචන අරමුදල නැවත ස්ථාපිත කිරීමට අදාළව අග්‍රාමාත්‍ය කාර්යාලයට අනුබද්ධ ජාතික මෙහෙයුම් මැදිරියේ නිර්දේශ අමාත්‍ය මණ්ඩලය වෙත යොමු කිරීමට නියමිතව ඇත. | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම. |
| (ii) මු.රෙ. 877 (2) (ඉ) | සියලුම ගණන්දීමේ නිලධාරීන් විසින් විගණකාධිපතිවරයා විසින් විගණනය කර ලබාදෙන | ඉදිරියේදී අරමුදලේ කාර්යය සාධන වාර්තාවක් සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි. මේ වන විටත් අරමුදලේ කාර්යය සාධනය පිළිබඳ විස්තරය | මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කිරීම |

| | | | |
|---|---|---|---|
| | විගණන වාර්තා ද ඇතුළත් කරමින් වාර්ෂික කාර්යසාධන වාර්තාව නියමිත විධිවිධාන යටතේ භාෂාත්‍රයෙන්ම සකස්කර මුදල් වර්ෂය අවසන් වී දින 150ක් ගත වීමට පෙර සභාගත කිරීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත්කල යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි. | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තු කාර්යය සාධන වාර්තාවට ඇතුළත් කරනු ලබයි. | |
| (ආ)ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 (අ). | අරමුදල සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු.2,207,265ක් වටිනා ස්ථාවර වත්කම් මිලදී ගෙන තිබුණ ද ප්‍රසම්පාදන සැලැස්මක් පිලියෙල කර නොතිබුණි. | ඉදිරියේදී වාර්ෂිකව ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර ඒ අනුව කටයුතු කරන බව දන්වමි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයට අනුකූලව කටයුතු කිරීම |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.334,633,332ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.252,377,705 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.82,255,627 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට වර්ෂයේ ආදායම වැඩි වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේශය |
|---|---|---|
| (i) වායු විමෝචන භාරකාර මණ්ඩලය ඇවර කර මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ අංශයක් ලෙස වායු විමෝචන ව්‍යාපෘති කාර්යාලයක් පිහිටුවීමට 2017 දෙසැම්බර් 10 දිනැති අංක DMS/1143/VETF කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු අනුමැතිය ලැබී තිබිය දී සහ අංක PED/RED/CIR/2018/02 දරණ 2018 අගෝස්තු 18 දිනැති ලිපිය මගින් වායු විමෝචන අරමුදල ඇවර කිරීම සඳහා භාණ්ඩාගාර ලේකම්වරයා විසින් නිර්දේශ ලබා දී තිබිය දී මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව යටතේ අංශයක් ලෙස ස්ථාපිත කිරීමකින් තොරව අනුමත කාර්ය මණ්ඩලයෙන් පරිබාහිර | වායු විමෝචන අරමුදල ඇවර කිරීම සම්බන්ධයෙන් මේ වන තෙක් අවසන් තීරණයකට පැමිණ නොමැති අතර මෙම කාර්යාලය මගින් වායු විමෝචන වැඩසටහනේ නියාමන කාර්යය සිදු කිරීම සඳහා වෙන්ව ඇති එකම ආයතනය වන බැවින් වාහන වායු විමෝචන පරීක්ෂණ ව්‍යාපෘති කාර්යාලයේ කාර්යයන් අනිකුත් සාමාන්‍ය රාජ්‍ය සේවයේ කාර්යයන්ට වැඩි විශේෂිත වූ සුදුසුකම් සහිත කාර්යමණ්ඩලයක් මගින් ඉටුකර ගත යුතුව ඇත. ඒ සඳහා කාර්යමණ්ඩලය දෙස් විදෙස් පුහුණුව සඳහාද ලක් කර ඇත.<br>ඒ අනුව කාර්ය මණ්ඩලය සඳහා තනතුරු නාම සකස් කර කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කලද 2017.12.10 දිනැති හා අංක MT/02/01/01/02/11/II දරණ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ ලිපියේ සඳහන් පරිදි | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තු ලිපියේ නිර්දේශ අනුව කටයුතු කිරීම |

| | | | |
|---|---|---|---|
| | වෙනත් තනතුරු පවත්වාගනිමින් වැටුප් හා දීමනා ගෙවීමට අරමුදලේ පාලක මණ්ඩලය කටයුතු කර තිබුණි. | ව්‍යාපෘති කාර්යාලය සඳහා තනතුරු රජයේ අනුමත සේවා වලින් ලබා ගැනීම යොජනා වී ඇති බැවින් මේ වන විට භාරකාර අරමුදලේ සේවයේ නියුතු නිලධාරින් එම සේවා වලට අන්තග්‍රහණය කිරීම සම්බන්ධයෙන් ගැටළුවක් මතු වී ඇත.<br>එසේම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් යොමු කර ඇති ලිපිය පරිදි ව්‍යාපෘති කාර්යාලයේ වියදම් අරමුදල මගින් ආවරණය කරගත යුතු බවද දන්වා ඇත. එබැවින් අරමුදල පිළිබඳ ප්‍රතිපත්තිමය තීන්දුව ලැබෙන තෙක් රාජකාරි ඉටුකරවා ගැනීමේ අවශ්‍යතාව මත ඉහත පරිදි කටයුතු කර ඇති බව දන්වා සිටිමි. | |
| (ii) | යම් තනතුරකට අදාළව ගිවිසගත් වැටුපක් මත එකී තනතුරට අදාළ රැකියා විස්තරයේ සඳහන් කාර්යයන් ඉටු කළ යුතු වන අතර එකී කාර්යයන් සඳහා අමතර ගෙවීමක් හිමි නොවේ. එහෙත් රැකියා විස්තරයෙහි දුම් පරීක්ෂණ වැඩසටහන් පැවැත්වීම, දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම වැනි වායු විමෝචනයට අදාළ කාර්යයන් සිදුකිරීම සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන ඇති ව්‍යාපෘති සහකාර, පර්යේෂණ සහකාර සහ ව්‍යාපෘති කාර්මික ශිල්පීන් 13දෙනෙකු වෙනුවෙන් මුදල් අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියක් මත රැකියා විස්තරය අනුව සිදු කළ යුතු කාර්යයන් සඳහා දිනකට රු.2,000 බැගින් සහභාගී වීමේ දීමනාවක් ගෙවීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල උක්ත විෂය වෙනුවෙන් විධිමත් අනුමැතියකින් තොරව රු.846,175ක දීමනා ලබා දී තිබුණි. | අරමුදලේ කාර්යයන් ඵලදායීව ඉටුකරවා ගැනීමට නිලධාරින්ගේ සහභාගීත්වය ලබාගැනීම සඳහා භාරකාර ගිවිසුම ප්‍රකාරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන මෙම ගෙවීම් සිදුකර ඇත. යම් නිලධාරියෙකු සංයුක්ත දීමනා ඉල්ලුම්කරන අවස්ථාවේදී මෙම ගෙවීම් සිදු කරනු නොලැබේ | විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම. |
| (iii) | මුදල් අමාත්‍යාංශය හෝ අදාළ වැටුප් බලධාරී ආයතන ව්‍යුහයන්ගේ අනුමැතියකින් තොරව 2022 දෙසැම්බර් 21 දින අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද අංක 2022/04 දරණ අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවට ලබාගත් අනුමැතියක් මත උපරිමය මාසයකට වාර 06ක් වන පරිදි වායු විමෝචන වැඩසටහන් සඳහා සහභාගි කරවා ගනු ලබන මධ්‍යම පරිසර අධිකාරියේ නිලධාරීන්, පොලිස් නිලධාරීන් වැනි බාහිර රාජ්‍ය නිලධාරීන් සඳහා එක් වරකට රු.2,000 බැගින් දීමනාවක් ද ක්ලීන්කෝ ලංකා හා ලාෆ් එකෝ ශ්‍රී පුද්ගලික සමාගම්හි කාර්මික ශිල්පීන් සඳහා එක් වරකට රු.1,000ක දීමනාවක් ද ගෙවීමට කටයුතු කර තිබුණි. සමාලෝචිත වර්ෂය තුල විධිමත් අනුමැතියකින් තොරව උක්ත | අරමුදලේ කාර්යයන් ඵලදායීව ඉටුකරවා ගැනීමට නිලධාරින්ගේ සහභාගීත්වය ලබාගැනීම සඳහා භාරකාර ගිවිසුම ප්‍රකාරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන මෙම ගෙවීම් සිදුකර ඇත. | විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම. |

| | | |
|---|---|---|
| විෂය සඳහා රු.1,230,500ක දීමනා ලබා දී තිබුණි. | | |
| (iv) වායු විමෝචන අරමුදල සඳහා කොන්ත්‍රාත් පදනම මත ව්‍යාපෘති සහකාර නිලධාරීන් තිදෙනෙකු, කාර්මික ශිල්පීන් දසදෙනෙකු, රියදුරන් දෙදෙනෙකු හා කාර්යාල කාර්ය සහායකයින් දෙදෙනෙකු බඳවාගෙන තිබු අතර ඔවුන්ගේ කොන්ත්‍රාත් ගිවිසුම් 2016, 2017 හා 2018 යන වර්ෂයන්හි දී අවසන් වී තිබුණි. එහෙත් එකී කොන්ත්‍රාත් ගිවිසුම් දීර්ඝ කිරීමකින් හෝ අලුත් කිරීමකින් තොරව සේවා ගිවිසුමක් රහිතව උක්ත නිලධාරීන් දාහත්දෙනා සමාලෝචිත වර්ෂය තුල සේවයේ යොදවා නීත්‍යානුකූල පදනමකින් තොරව රු.8,585,980 වැටුප් හා දීමනා ලබා දී තිබුණි. | මෙහි සඳහන් සියලුම නිලධාරින්ගේ සේවාව ලබා ගැනීම සඳහා සියලුම වර්ෂයන්ට අදාලව භාරකාර මණ්ඩලයේ අනුමැතිය ලබා ගෙන ඇති අතර භාරකාර අරමුදල අහෝසි කර දැනට සේවයේ යොදවා ඇති පිරිස ස්ථිර සේවයට අන්තග්‍රහණය කිරීමේ අරමුණින් කටයුතු කර ඇති අතර සියලුම නිලධාරින්ට අදාල පත්වීම් ලිපි සහ සේවා ගිවිසුම් අත්සන් කර ඇති බව දන්වා සිටිමි. | විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම. |
| (v) 2023 වර්ෂය සඳහා සකස් කරන ලද අයවැය ප්‍රතිපාදනයන්හි වෙනත් බාහිර ආයතන වෙත අරමුදල් ප්‍රදානය කිරීමක් ලෙස ඇතුළත්ව නොතිබිය දී සහ මුදල් අමාත්‍යාංශයේ හෝ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියක් මත 2023 අගෝස්තු 17 වන දින පරිසර අමාත්‍යාංශය වෙත රු.1,383,500ක මුදලක් ප්‍රදානය කර තිබුණි. | වාහන වායු විමෝචන අරමුදල පිහිටුවීමේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට අදාල කාර්යභාරයට අයත් වැඩසටහනක් සඳහා භාරකාර ගිවිසුම ප්‍රකාරව භාරකාර මණ්ඩලයේ අනුමැතිය මත මෙම අරමුදල් ලබා දෙන ලදී. | විධිමත් අනුමැතියක් මත වියදම් සිදු කිරීමට පියවර ගැනීම. |
| (vi) වායු තත්ත්ව මැනීමේ උපකරණ සම්බන්ධයෙන් 2020 ජනවාරි 16 හා 2020 නොවැම්බර් 03 දින අරමුදලේ භාරකාර මණ්ඩලය ගෙන ඇති තීරණය ප්‍රකාරව එකතු පිරිවැය රු.මිලියන 82.752ක් වන Eco Tech මාදිලියේ ස්ථාපිත සංසරණ වායු තත්ත්ව මැනීමේ ඒකක 02ක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත පවරා දීමට කටයුතු කර ඇති නමුත් අදාල ආයතනය වෙත පවරා ඇති උපකරණවල මෙහෙයුම් අලුත්වැඩියා හා නඩත්තු සේවා සඳහා මධ්‍යම පරිසර අධිකාරිය වෙත සමාලෝචිත වර්ෂයේ අයවැය මගින් ප්‍රතිපාදන සලසා නොමැති රු.3,437,358ක වායු විමෝචන අරමුදලට අදාල නොවන පිරිවැයක් දරා තිබුණි. | වාහන වායු විමෝචන භාරකාර අරමුදල ස්ථාපිත කර ඇත්තේ සමස්ථ වායු දූෂණය අවම කිරීමේ අරමුණුන් වේ. ඒ අනුව වාහන වලින් ප්‍රමුඛව, අනෙකුත් ප්‍රභව වලින් සිදුවන වායු දූෂණය අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීමට විද්‍යාත්මක මට්ටමේ වායු තත්වයන් මැනීමේ උපකරණ මිලදී ගැනීමට හා එවා තිරසාරව නඩත්තු කිරීමට සිදුවන අතර ඊට විශාල මුදලක් වැය කිරීමට සිදුවේ. මෙම අරමුදල ඇති කිරීමේ මූලික අරමුණු අතර වායු තත්වය ගුණාත්මක භාවයෙන් වැඩි දියුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම ප්‍රධාන වේ. එවැනි කටයුතු සඳහා රජයට අමතර පිරිවැයක් දැරීමට නොදී මෙම අරමුදල මගින් මුදල් ප්‍රතිපාදන වැය කිරීම සිදු කරනු ලබයි. ඒ අනුව වායු තත්වයන් පිළිබඳ නිවැරදි ප්‍රතිපත්තිමය තීන්දු තීරණවලට එළඹීම සඳහා වායුවේ ගුණාත්මකභාවය පිළිබඳ තොරතුරු ලබාගැනීමට බලයලත් රාජ්‍ය ආයතන වෙත මෙලෙස මුදල් ලබාදී ඇත. | වියදම් පාලනයට අදාළව නිසි ක්‍රමවේදයක් සකස් කිරීම |
| (vii) මධ්‍යම පරිසර අධිකාරිය හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව අතර ඇති | 2020.01.16 වන දින පැවති භාරකාර මණ්ඩල රැස්වීමේදී මෙම ඒකකය අවුරුදු ගණනාවක් අක්‍රියව | රාජ්‍ය සම්පත් ඵලදායී ලෙස |

| | | | |
|---|---|---|---|
| | කරගත් ගිවිසුමකට අනුව රු.මිලියන 30.82ක වියදමින් 2013 වර්ෂයේ ජංගම සංසරණ වායු තත්ත්ව අධීක්ෂණ මධ්‍යස්ථානයක් අරමුදල විසින් මධ්‍යම පරිසර අධිකාරිය වෙත ලබාදී ඇති නමුත් 2016 වර්ෂයේ සිට එකී උපකරණ කට්ටලය ක්‍රියා විරහිත වීම හා අළුත්වැඩියාවට අදාල කටයුතු සිදු නොකිරීම හේතුවෙන් අදාළ උපකරණ කට්ටලය හා එකී උපකරණ කට්ටලය ස්ථාපිත කර ඇති ලොරි රථය කිසිදු භාවිතයකින් තොරව දිරාපත්වීමට ඉඩදී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව මෙම උපකරණ කට්ටලය නීත්‍යානුකූල හිමිකම හා නඩත්තු වගකීම අරමුදල සතුව පවතින අතර එකී උපකරණ අලුත්වැඩියා කරන්නේ ද නැතහොත් අපහරණය කරන්නේද යන්න පිළිබඳව කාලීනව තීරණය කර අදාල පරිදි කටයුතු කිරීමට අරමුදලේ කළමනාකරණය අපොහොසත් වී තිබුණි. | පැවතීම නිසා අළුත්වැඩියාව කලද එම අළුත්වැඩියාව සාර්ථක වී නිවැරදිව දත්ත ලබාගෙන ඵලදායී ලෙස වායු තත්ව මැනීම සම්බන්ධව තාක්ෂණික වාර්තාවක් ඉදිරිපත් කරන ලෙස දන්වා සිටින ලදී. ඒ අනුව තාක්ෂණික ඇගයීම් කමිටුවක් මගින් භාරකාර මණ්ඩලයට මෙම අළුත්වැඩියාව සම්බන්ධව පහත නිර්දේශ ලබා දෙන ලෙස දන්වා යවා ඇත.<br>01.මෙම "Environment SA" ජංගම සංසරණ වායු තත්වය මැනීමේ ඒකකයේ සියළු විශ්ලේෂක වලින් ඉදිරි අළුත්වැඩියාවෙන් පසු නිවැරදි දත්ත ලබා ගත හැකි බව.<br>02.මෙම උපකරණයේ තාක්ෂණය දැනට පවතින පද්ධති සමග යාවත්කාලීන බව හා ගැලපෙන බව.<br>ඒ අනුව මෙම උපකරණ ස්ථාවර උපකරණ ලෙස පාවිච්චි කිරීමටත් පුහුණු කටයුතු සඳහා භාවිතා කිරීමට ඇති හැකියාව මත ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත පවරාදී ඇත. | උපයෝජනය කිරීමට කටයුතු කිරීම. |
| (viii) | වායු තත්ත්ව සහ දත්ත කළමනාකරණ පද්ධතිය ඒකාබද්ධ කිරීම හා බෙදා හැරීම සඳහා ජාතික වේදිකාවක් සංවර්ධනය කිරීම සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය හා මධ්‍යම පරිසර අධිකාරිය එක්ව ඉදිරිපත් කර තිබූ යෝජනාවලිය ත්‍රෛපාර්ශවිකව ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂයේ අයවැය ලේඛණය මගින් රු. මිලියන 150ක ප්‍රතිපාදන වෙන්කර දී ඇතත් උක්ත කාර්යයට අදාල කාර්යයන් සමාලෝචිත වර්ෂය තුල සිදුකර නොතිබුණි. එකඟ වූ කොන්දේසි ප්‍රකාරව අදාල ආයතන සිදු කල යුතු කාර්යයන්ගේ ප්‍රගතිය පරීක්ෂාකර බලා අදාල ගෙවීම් කටයුතු සිදුකල යුතු වුවත්, ප්‍රගතිය පරීක්ෂාවකින් තොරව හා සිදු කල යුතු කාර්යයන් තහවුරු කර ගැනීමකින් තොරව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත රු.මිලියන 9ක් ගෙවීමට කටයුතු කර තිබුණි. | අදාල කාර්යය සිදු කිරීමට අවශ්‍ය ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙත මුදල් ලබා දී ඇත. | සුපරික්ෂාකාරීව අරමුදල් වැය කිරීමට කටයුතු කිරීම. |
| (ix) | අරමුදල විසින් ආයෝජනයන් සිදු කිරීමට පෙර මුදල් අමාත්‍යවරයාගේ, භාණ්ඩාගාර ලේකම්වරයාගේ, අමාත්‍ය මණ්ඩලයේ අනුමැතියකින් | අරමුදලේ අතිරික්ත මුදල් මහ භාණ්ඩාගාරය වෙත මාරු කරනුයේ වාහන වායු විමෝචන භාරකාර අරමුදල් මණ්ඩලයෙන් ලබා ගන්නා අනුමැතියට යටත්වයි. එබැවින් 2023 වර්ෂයේදී මහා | අතිරික්ත මුදල් භාණ්ඩාගාරයේ ලේකම්ගේ අනුමැතිය ඇතිව |

| | | | |
|---|---|---|---|
| | තොරව අරමුදලේ අතිරික්ත මුදලින් රු.500,000,000ක් දක්වා වූ මුදලක් භාණ්ඩාගාරය වෙත මාරු කිරීමකින් තොරව ස්ථාවර තැන්පතුවල ආයෝජනය කර තිබුණි. අරමුදලේ ගිණුම අනුව 2023 දෙසැම්බර් 31 දින දක්වා සමුච්චිත වී ඇති ලාභය රු.මිලියන 612.023ක් වන නමුත් එකී සමුච්චිත ලාභය ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමකින් තොරව රු.මිලියන 551.888ක් ස්ථාවර තැන්පතුවල හා රු.මිලියන 60.135ක් ඉතුරුම් තැන්පතුවල ආයෝජනය කර තිබුණි. | භාණ්ඩාගාරයේ ඉල්ලීම මත භාරකාර මණ්ඩලයේ අනුමැතියට යටත්ව රු.200,000,000/- මහා භාණ්ඩාගාරය වෙත මාරු කර ඇත. ගිණුමේ අතිරික්ත මුදල් පවතින අවස්ථාවලදී භාරකාර ගිවිසුමේ ප්‍රතිපාදන ප්‍රකාරව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්ගේ සහ භාරකාර මණ්ඩලයේ උපදෙස් පරිදි ආවරණ අනුමැතියට යටත්ව දැනට ගිණුම් පවතින මහජන බැංකුවේ කෙටිකාලීන ස්ථාවර තැන්පතුවල ආයෝජනය කරන ලදී. නමුත් භාණ්ඩාගාරයේ අතිරික්ත මුදලින් කොටසක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම් වලදී භාණ්ඩාගාරය වෙත මුදල් ප්‍රේශණය කර තිබේ.අරමුදලේ අතිරික්ත මුදල් රාජ්‍ය මුල්‍ය දෙපාර්තමේන්තුවේ ඉල්ලීම පරිදි භාරකාර මණ්ඩලයේ අනුමැතියට යටත්ව පමණක් ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලබයි. ඒ අනුව 2023 වර්ෂයේදී රු. මිලියන 200 මුදලක් එකාබද්ධ අරමුදලට බැරකර ඇත. | ආයෝජනය කිරීම හෝ රාජ්‍ය මුදල් නිසි පරිදි ඒකාබද්ධ අරමුදල වෙත බැර කිරීමට කටයුතු කිරීම. |
| (x) | අරමුදල විසින් රැස්කර ගන්නා ආදායම් කාලීනව අරමුදලේ අරමුණු වලට අනුකූල වන සේ කෙටිකාලීන හා දිගු කාලීන ආයෝජනයන්හි යෙදවිය යුතු නමුත් අරමුදල වෙත ලැබී ඇති ආදායම් වලින් රු.මිලියන 165ක් දක්වා එවැනි සුදුසු ආයෝජනයන්හි යෙදවීමකින් තොරව ඉතුරුම් ගිණුමක රඳවා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල ආසන්න වශයෙන් රු.8,568,535ක පොලී ආදායමක් අහිමි වී තිබුණි. | 2023 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු සිදු කිරීමේදී හදිසියේ ඇතිවන වියදම් දැරීම සඳහා යම් මුදලක් ඉතිරි කිරීම් ගිණුමේ රඳවා ගන්නා ලදී. තවද භාරකාර මණ්ඩලයේ උපදෙස් පරිදි අනිකුත් සෑම අවස්ථාවකදීම අතිරික්ත මුදල් ආයෝජනය කර ඇත. | අරමුදල් ඵලදායී ලෙස ආයෝජනය කිරීමට කටයුතු කිරීම |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | රථවාහන ආශ්‍රිත වායු දූෂණය, ශ්‍රී ලංකාවේ ප්‍රධාන නගරවල වාතයේ තත්ත්වය, බලශක්තිය, පරිසරය හා ආර්ථික බලපෑම් වැනි විවිධ පර්යේෂණයන් සඳහා 2012 වර්ෂයේ සිට 2023 වර්ෂය සඳහා වායු විමෝචන අරමුදල මගින් රු.මිලියන 29.52ක වියදමක් දරා ඇති නමුත් එකී ව්‍යාපෘතීන් මගින් ලබාගත් අවසන් පර්යේෂණ වාර්තා ලබාගෙන කිසිදු සාධනීය ක්‍රියාමාර්ගයක් වෙනුවෙන් වැඩපිළිවෙළක් සකස් කර ක්‍රියාත්මක කර නොතිබුණි. | මේ වන විට සියළුම පර්යේෂණ වාර්තාවන් ලැබී ඇති බව දන්වා සිටින අතර පර්යේෂණ වාර්තා මගින් ලබා දී ඇති නිර්දේශ ක්‍රියාත්මක කිරීම හා අදාල දත්ත ඒ පිළිබද උනන්දුවක් දක්වන පාර්ශවයන්ට මෙන්ම පරිසර අමාත්‍යාංශයේ වායු සම්පත් කළමනාකරණ ඒකකය වෙත භාරදීමට කටයුතු කර ඇති බව දන්වා සිටින අතර අපගේ වෙබ් අඩවියේ මෙන්ම පරිසර අමාත්‍යාංශයේ වෙබ් අඩවියේ එල කිරීමට කටයුතු කර ඇත. | ලබා ගත් පර්යේෂණ වාර්තා සාධනීය ක්‍රියාමාර්ගයක් වෙනුවෙන් වැඩපිළිවෙලක් සැකසීම. |
| (ii) | වායු විමෝචන පරීක්ෂණ සඳහා කොන්ත්‍රාත් ප්‍රදානය කර ඇති පුද්ගලික සමාගම් දෙක සමඟ ඇති කරගෙන ඇති ගිවිසුම්වල 4.1 ඡේදය ප්‍රකාරව | සමාගම් අතර ඇති ගිවිසුම අනුව වාහන වායු විමෝචන පරීක්ෂාවකින් අරමුදලට ලැබිය යුතු මුදල වැඩකරන දින 07 ක් තුල ලැබිය යුතුය. ඒ | ආදායම නිසි ලෙස හඳුනා ගැනීමට නිසි |

| | | |
|---|---|---|
| කොන්ත්‍රාත්කරුවන් විසින් එදිනෙදා ලබන දෛනික ආදායමෙන් සියයට 10ක මුදලක් දින හතක් ගතවීමට පෙර වායු විමෝචන අරමුදල වෙත ප්‍රේෂණය කළ යුතු වේ. ගිවිසුම්ගත එක් කොන්ත්‍රාත්කාර සමාගමක් උක්ත කොන්දේසිය සම්පූර්ණ වන පරිදි දින හතක් තුළ අදාල මුදල වායු විමෝචන අරමුදල වෙත ගෙවා ඇති නමුත් අනෙක් කොන්ත්‍රාත් සමාගම උක්ත කොන්දේසිය සම්පූර්ණ වන සේ අදාළ කාලය තුළ අරමුදල වෙත මුදල් ප්‍රේෂණය කර නොතිබුණි. ගිවිසුම ප්‍රකාරව ප්‍රමාද වන දිනකට සියයට 3ක් බැගින් අධිභාරයක් අය කළ යුතු වුවත් වායු විමෝචන අරමුදල විසින් එවැනි අධිභාරයක් අය කිරීමට කටයුතු කර නොතිබූ අතර විගණනය විසින් සිදුකළ ගණනය කිරීම් අනුව 2023 වර්ෂය තුළ දිනක්, දින දෙකක් හා දින තුනක් ලෙස ප්‍රමාද වී ගෙවීම් කළ අවස්ථා වෙනුවෙන් ආසන්න වශයෙන් රු.1,189,569ක අධිභාරයක් අය කළ යුතුව තිබුණි. සමාගම් විසින් දෛනිකව එකතු කරන ලද ආදායම හඳුනාගත හැකිවන පරිදි වාර්තා ඉදිරිපත් නොකරන හෙයින් ගිවිසුම් ප්‍රකාරව අය විය යුතු ප්‍රමාද ගාස්තු ගණනය කිරීම ගැටලුකාරී වී තිබුණි. | අනුව මුදල් ලැබී ඇති අතර දක්වා ඇති විචලයක් නිරික්ෂණය නොවේ. තවදුරටත් මෙම සැසඳීම පහසු කරගැනීම සඳහා එදිනෙදා මුදල් ඊට පසුදිනම බැරකරන ලෙස ආයතන වෙත උපදෙස් ලබාදී ඇත. මේ වනවිට ඔවුන් ඒ අනුව දෛනික මුදල් බැරකරමින් පවතින බව දන්වමි. 2024 ජනවාරි මස සිට දෛනිකව ආදායම් හඳුනාගත හැකිවන පරිදි දුම් පරික්ෂණ සිදුකරන සමාගම් දෙකෙන්ම වාර්තා ලබා ගැනීම සිදු කරනු ලබයි. | ක්‍රමවේදයක් සකස් කිරීම. |
| (iii) වායු විමෝචනය සම්බන්ධයෙන් දැනුවත් කිරීම් වැඩසටහන් තුලින් අපේක්ෂිත අරමුණු, එම අරමුණු ඉටුකර ගැනීමට සිදුකල යුතු කාර්යයන්, ප්‍රගතිය මැනිමේ නිර්ණායකයන් ඇතුලත්ව වායු විමෝචනය වැඩසටහන් සඳහා සිදුකරනු ලබන වියදම් සම්බන්ධයෙන් පූර්ව ඇගයීම් සහිත විධිමත් ව්‍යාපෘති වාර්තාවක් අනුමත කරගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුල දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා රු.4,308,425ක වියදමක් දරා තිබුණි. | මෙම වැඩසටහන වඩාත් ඵලදායීව සිදු කිරීමට වායු විමෝචන පරික්ෂණ මධ්‍යස්ථාන විසින් එම පරික්ෂණ කාර්යය නිසි පරිදි සිදු කල යුතු අතර ඒ සඳහා සහභාගී වන වාහන හිමියන් /රියදුරන් ඒ සම්බන්ධයෙන් පූර්ණ දැනුවත් බවක් ලබා තිබිය යුතු වේ. එසේම නීතිය ක්‍රියාත්මක කරනු ලබන පොලිස් නිලධාරින්ද මේ සම්බන්ධයෙන් දැනුවත් වීමත් සිදු විය යුතු වේ. ඒ අනුව අපගේ ක්‍රියාකාරී සැලැස්මේ දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා වෙන් කර ඇති මුදල් අනුව දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කර ඇත. මෙම වැඩසටහන හුදෙක් තාක්ෂණික කරුණු පදනම් කර ගනිමින් සිදු වන බැවින් යාවත්කාලීන තොරතුරු පිළිබඳව දැනුවත් කිරීම වැදගත් වේ. තවද මෙවැනි වැඩසටහන් සිදු කිරීම මගින් පොලිස් නිලධාරින් මෙම වැඩසටහන සඳහා ඔවුන්ගේ සෘජු දායකත්වය ලබා දෙන අතරම සෑම දැනුවත් කිරීමක් අවසානයේදීම අදහස් හා යෝජනා ලබා ගන්නා අතර එහිදී ඔවුන් විසින් සැමවිටම යහපත් ප්‍රතිචාර ලබා දී ඇත. එසේම වායු විමෝචන වැඩසටහනට අදාල භාරකාර ඔප්පුවේ (DEED OF TRUST) හි ඇතුලත් අරමුණු 07 හිද මෙම දැනුවත් කිරීමේ වැඩසටහන් සිදු කළ යුතු බවද සඳහන් වේ. | අරමුදල් ඵලදායී කාර්යයහි යෙදවීම |

## 3.3 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිදේර්ශය |
|---|---|---|
| වායු විමෝචන භාරකාර අරමුදල රු.මිලියන 82.75ක වියදමක් දරා සංසරණ වායු තත්ත්ව මැනීමේ ඒකක දෙකක් මධ්‍යම පරිසර අධිකාරිය වෙත හා රු.මිලියන 47.24ක පිරිවැය සහිත ජංගම සංසරණ වායු තත්ත්ව මැනීමේ උපකරණය ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය වෙත ලබාදී තිබුණි. ගිවිසුම් ප්‍රකාරව අදාළ උපකරණ මගින් ලබාගන්නා මිනුම් දත්ත අරමුදල වෙත ලබාදිය යුතු නමුත් උක්ත වායු තත්ත්ව මැනීමේ උපකරණය මගින් ලබාගන්නා මිනුම් දත්ත භාවිතයෙන් සිදු කළ යුතු කාර්යයක් සම්බන්ධයෙන් පූර්ව නිශ්චිත වැඩපිළිවෙළක් නොමැති වීම හා එකී මිනුම් දත්ත භාවිතා කර කිසිදු ප්‍රයෝජනවත් කාර්යයක් සිදු නොකිරීම හේතුවෙන් රු.මිලියන 130කට අධික රජයේ මුදල් ආයෝජනය හා උපකරණ මගින් ලබාගෙන ඇති මිනුම් දත්ත නිෂ්කාර්යය වී තිබුණි. | මෙම උපකරණ මිලදී ගැනීමේ ප්‍රධාන අරමුණ වන්නේ වායු තත්ව කළමනාකරණ සඳහා අවශ්‍ය දත්ත ලබා ගැනීම හා එවා මහජනතාවට ප්‍රදර්ශනය කිරීමත්ය. ඒ අනුව , AIR QUALITY INDEX එකක් සාදා ඇති අතර ඒ අවට වායු තත්වයේ ගුණාත්මක තත්වය එමගින් ප්‍රදර්ශනය කරනු ලබයි. තවද මෙම ඒකක මගින් ලබා ගන්නා ලද දත්ත, එම දත්තයන් පිළිබඳ උනන්දුවක් දක්වන පාර්ශව වෙත ලබා ගැනීම සඳහාත්, මහජනතාවට ප්‍රදර්ශනය කිරීම සඳහත් මධ්‍යම පරිසර අධිකාරියේ හා ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවි වල දක්වා ඇත. ඊට අමතරව , මෙම දත්ත පරිසර අමාත්‍යාංශයේ වායු තත්ව කළමනාකරණ කේන්ද්‍රය මගින් වායු තත්ත්ව කළමනාකරණය කිරීම සම්බන්ධ ප්‍රතිපත්ති, තීරණ හා ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහාත් යොදා ගැනීමට යොමු කර ඇති බව දන්වමි. | වත්කම් නිශ්කාර්ය නොවන ලෙස උපයෝජනය කිරීම. |